හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

--------------------------------

පොළොන්නරුව දිස්ත්‍රික්කය

---------------------------------

1 මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 20 මාර්තු 2018 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්වාගණනය කල මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හිගුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------------

ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු. 99,918 ක පොත් ගිණුම්ගත නොකිරීම සහ සභාව විසින් මිල දී ගෙන තිබුණු රු. 195,219 ක් වූ පොත් රු. 152,127 ක් ලෙස දැක්වීම නිසා පුස්තකාල පොත් රු. 143,010 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) හිඟුරක්ගොඩ බස් නැවතුම්පොල අසල රු.58,405,927 ක්වැයකර ඉදිකර තිබූ වෙළඳ සංකීර්ණයේ මුළු වටිනාකමින් රු. 40,661,274 ක්හා ජයන්තිපුර පුස්තකාල ගොඩනැඟිල්ලට හා පුලස්තිගම පෙර පාසලට අලුතින් කොටස් එකතු කිරීම සඳහා දරන ලද පිළිවෙලින් රු. 487,807 ක හා රු. 793,640 ක වියදම් ඇතුළුව එකතුව රු. 41,942,721 ක්ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින ආදායම් වෙනුවෙන් තැන්පත් ශේෂය වූ රු. 1,226,727 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම්තුල සංකේත දෙකක්යටතේ දක්වා තිබීම හේතුවෙන් ජංගම වගකීම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ(NELSIP)අරමුදල් යටතේ බස් නැවතුම්පල අසල වෙළඳ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු. 9,777,242 ක් ණයහිමියෝ යටතේ දක්වා නොතිබුණි.

(ඉ) පොදු පරිපාලනවැඩසටහනට අදාල ප්‍රාග්ධන වියදම් රු. 567,565 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වන අතිරික්තය එම වටිනාකමෙන් වැඩියෙන් දැක්වුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

(උ) පරිත්‍යාග ලෙස සභාව වෙත ලැබී තිබූ බෝට්ටුව, අගුල හා ජල බවුසරයේ වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 10 කට පමණ පෙර සිට පැවත එන දේශීය ආදායම් කොමසාරිස්ට ගෙවිය යුතු රු. 3,633,582 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පැවති රු. 4,540,522 ක කොන්ත්‍රාත් අත්තිකාරම් ශේෂය හා රු. 2,184,642 ක තත්කාර්ය අත්තිකාරම් ශේෂනිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 471,661,972 ක් වූ ගිණුම් විෂයයන් 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

---------------------

1.3.5.1 නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| (i) | 24 වගන්තිය | | ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පාරවල්වල සහ පටුමාවත්වල ස්ථිර සලකුණු සහ සීමා ලකුණු කිරීම,සැලැස්ම පිළියෙල කිරීම හා ඒවායේ නාම ලේඛනයක් දක්වමින් දැන්වීම් පල කිරීම සිදුකර නොතිබුණි. |
| (ii) | 158 වගන්තිය | 2,594,115 | හිඟ හිටි වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) | රීති 33 | | එක් එක් කාර්තුව අවසානයේදී සභාව විසින් වරිපනම් බදු ගෙවීම් පැහැර හරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සකස්කර දේපල තහනම් කිරීමේ වරෙන්තුපිළියෙල කර නොතිබුණි. |
| (ii) | රීති අංක 59 සිට 63 දක්වා | | සෑම වර්ෂයක් ආරම්භයේදිම බල ප්‍රදේශය තුල පවතින කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණු අතර කර්මාන්ත බදු ගෙවන ලෙස නිවේදන යවානොතිබුණි.බදු ගෙවීම් පැහැර හරින්නන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර අයවිය යුතු බදු අයකර ගෙන නොතිබුණි. |
| (iii) | රීති 127 | 3,209,789 | වැය සම්මත 13 ක පරිපූරක වැය සඳහා සභාවේ පූර්ණඅනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (iv) | රීති 154 | | සියලු උප කාර්යාල සම්බන්ධයෙන් වූ එකතු කිරීම් පිළිබඳ ගිණුම් ලේඛන පි.එස්.9 ආකෘති පත්‍රය ප්‍රකාරව සභාවේ ප්‍රධාන කාර්යාලයෙහි පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (v) | රිති අංක 180 | | මුදල් හෝ ගබඩා කටයුතු භාරව ක්‍රියාකරන හා ආදායම් එකතු කිරීමේ කාර්යයේනිරත නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |
| (vi) | රීති 188-190 | | 2014 වර්ෂය සඳහා සිදුකරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් පසු වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (vii) | රීති අංක 218 | | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැඟිලි පරීක්ෂාවක් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයන් වෙනුවෙන් සිදුකර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | XIX වැනි පරිච්ඡේදය 7 වගන්තිය | ස්ථාන මාරුවීම හා විශ්‍රාම යාම හේතුවෙන් රජයේ නිවාසවල පදිංචි වීම සඳහා ඇති සුදුසුකම අහෝසි වූ නිලධාරීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

**02 මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, සභාවේ පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 8,816,876 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 16,564,229 ක් විය.

2.2 මූල්‍ය පාලනය

-----------------

(අ) රාජ්‍ය බැංකු 02 ක රු. 114,168 ක ශේෂයන් සහිත ගිණුම් 02 ක් වර්ෂ 03 හා වර්ෂ 06 ක සිට අක්‍රීය බවට පත්වී තිබුණි.

(ආ) සභාව සතු රජයේ නිවාසයක් කුලී අයකිරීමකින් තොරව ගිවිසුමක් රහිතව රජයේ කාර්යාලයක් සඳහා ලබාදී තිබුණි. මීට පෙර අමාත්‍යාංශයක ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වාගෙන යාමට කුලී අයකර ගැනීමකින් තොරව ලබාදී තිබුණු මෙම නිවසේ හිඟ විදුලි බිල වූ රු. 102,982 ක් හා හිඟ ජල බිල්පත් වූ රු. 28,233 ක් සභා අරමුදලින් 2016 සැප්තැම්බර් ගෙවීම් කර තිබුණද එම මුදල් අදාල ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ)(i) 2017 දෙසැම්බර් 31 දිනට ජයන්තිපුර බැංකුවේ පවත්වාගෙන යන ජංගම ගිණුමේ ශේෂය රු. 196,023 ක් වුවද බැංකු සැසඳුමෙහි එය රු. 229,403 ක් ලෙස පෙන්වා තිබුණි. දිගින් දිගටම පැවතුණ මෙම වෙනස නිරවුල් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ii) 2007 වර්ෂයේ සිට බැංකු සැසඳුම් ප්‍රකාශවල අතැති මුදල් යටතේ දක්වන නමුත් භෞතික ශේෂයක් නොපවතින රු. 64,291 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2002 දෙසැම්බර් 31 දින සිට තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් ලෙස රු. 51,490 ක් බැංකු සැසඳුමෙහි දිගින් දිගටම ඉදිරියට ගෙනවිත් තිබුණද උපලබ්ධි නොවීමට හේතුව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු කුලී | 14,566,870 | 3,362,238 | 3,115,160 | 3,101,407 | 18,374,659 | 2,888,330 | 2,781,981 | 3,152,151 |
| කුලී | 3,494,480 | 11,861,800 | 6,777,897 | 11,521,830 | 3,732,300 | 6,449,699 | 3,292,339 | 3,818,657 |
| වෙනත් ආදායම් | 18,686,100 | 18,223,421 | 11,471,980 | 55,718,187 | 19,351,720 | 82,882,199 | 9,732,093 | 4,0674,092 |
| | 36,747,450 | 33,447,459 | 21,365,037 | 70,341,424 | 41,458,679 | 92,220,228 | 15,806,413 | 47,644,900 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් රු. 36,747,450 ක ආදායමක් ඇස්තමේන්තුගත කර තිබුණද රැස්කර තිබූ ආදායම රු. 21,365,037 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට රු. 70,341,424 ක හිඟ ආදායමක් පැවති අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 47.6 කින් ඉහළ ගොස් තිබුණි.

### 2.3.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු අයකිරීම2005 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සිදු කිරීම නිසා සභාවට විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) 2005 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව සඳහා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) බදු ප්‍රතිශතය ගැසට් කිරීමකින් තොරව සභාව විසින් විනෝද බදු ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 112,208 ක් අයකරගෙන තිබුණි

(ඈ) ජල ගාස්තු සහ කසළ බදු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

### 2.3.4 කුලී

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළමු වන හරස් විදියේ ගොඩනැගිල්ලෙහි කඩ කාමර 02 ක් අබලන් බව දක්වමින්2015 වර්ෂයේ සිට කඩ කුලී අයකර ගෙන නොතිබුණි.

(ආ) සභාව සතු කඩ කාමර 82 ක් ඒවායේ ගිවිසුම්ගත කුලීකරුවන් විසින් අතුරු බදුදීම මඟින් වර්තමාන තක්සේරු මුදලට වැඩි විශාල ආදායමක් උපයමින් තිබූ අතර සභාව විසින් කුලීකරුවන් සමඟ ඇතිකරගත් ගිවිසුම් යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

(ඈ) කුලී නොගෙවන කඩ හිමියන්ගේ කඩ මුද්‍රා තැබීමට පියවර ගනිමින් සිටියදී 2017 අගෝස්තු 14 දින පැවති දිස්ත්‍රික් සංවර්ධන කමිටුව වෙත මින්නේරිය නගරයේ කඩහිමියන් විසින් හිඟ කුලී පිළිබඳව ඉදිරිපත් කරන ලද සාවද්‍ය කරුණු ඇතුලත් ලිපිය පදනම් කර ගනිමින් කඩ මුද්‍රා තැබීම නතර කර දැමීමට තීරණය කර තිබුණි.

(ඇ) ගිවිසුම්කරුවන් විසින් කඩ කාමරවලට අදාල ගිවිසුම් උල්ලංඝනය කරන අවස්ථාවලදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.5 වෙනත් ආදායම්

----------------------

ප්‍රචාරණ දැන්වීම් ගාස්තුඅයකරගැනීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණු අතර අයකල යුතු ගාස්තු පිළිබඳව ගැසට් කර නොතිබුණි. නමුත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල විශාල දැන්වීම් ප්‍රමාණයක් ප්‍රචාරණය කරමින් පැවතුණු අතර ආදායම් පරීක්ෂකවරුන් විසින් දැන්වීම් පුවරු සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකර ලේඛනගත කර නියමිත ගාස්තු අයකරගෙන නොතිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

3.1 කාර්ය සාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් රු. 5,025,000 ක ප්‍රතිපාදන සලසා තිබූ ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 27 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිට කාරණා 19 ක් වෙනුවෙන් සකස් කරගෙන තිබුණු අතුරු ව්‍යවස්ථා අදාල කරගෙන තිබුණු අතර කාරණා 08 ක් සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කල යුතුව පැවතුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 27 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් අනවසරයෙන් කසළ බැහැර කරන රොට වැව වන රක්ෂිතයේ කසළ කන්දට ගිනි ඇවිලෙමින් තිබුණු අතර ඒ හේතුවෙන් වන රක්ෂිතය තුල පවතින කුඩා තෘණ වර්ග හරහා වනය ඇතුලත ගිනි ගැනීම් ඇතිවීමේ අවදානමක් පැවතුණි.

(ii) අලින් ඇතුළු වනජීවීන් විසින් පොලිතින් සහිත කසළ ආහාරයට ගැනීම නිරන්තරයෙන් සිදුවන බැවින් එයසතුන්ගේ ජීවිතවලට තර්ජනයක් ව පැවතුණි.

(iii) වර්ෂා කාලයේදී කසල සමඟ මිශ්‍රවූ ජලය කසළ ගොඩ ආසන්නයේ පවතින ඇල මාර්ග ඔස්සේ පානීය ජල මූලාශ්‍ර වලට එකතු වීමේ අවදානමක් පැවතුණි.

(iv) සභාව විසින් විධිමත් පරිදි කසළ රැගෙන නොයන බවට විවිධ පාර්ශව විසින් පැමිණිලි කර තිබුණද ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(v) කසළ වර්ගීකරණය කර භාරදෙන ලෙස මහජනයා දැනුවත් කර තිබුණද වර්ගීකරණය කිරීමකින් තොරව කසළලබාදීම පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන කිසිදු වර්ග කිරීමකින් හා ප්‍රතිචක්‍රීකරණය කිරීමකින් තොරව කසළ බැහැර කරමින් පැවතුණි.

(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණ ද එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

(ii) අයවැය සකස් කිරීමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජූලි 31 දිනැති අංක BD/CBD/4/1/2-2018 චක්‍රලේඛයෙන් හඳුන්වා දී තිබුණු දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි.

(iii) ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා වූ සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබු බැවින් දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි.

(iv) 2016 හා 2017 වර්ෂවල තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා අවශ්‍යමූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි.

(v) ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයන් නොපැවති අතර අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි.

(ඊ) පාරිසරික ගැටළු

--------------------

සුදුසු ස්ථානයක් නොතිබීම හේතුවෙන් 2016 ඔක්තෝබර් 26 දින සිට 2018 පෙබරවාරි 06 දින දක්වා මල අපද්‍රව්‍ය ප්‍රවාහන කටයුතු සිදුකර නොතිබුණි. මහජන සෞඛ්‍යට තර්ජනයක් වෙමින් පැවතීම හේතුවෙන් 2018 පෙබරවාරි 26 සිට නැවත මල අපද්‍රව්‍ය ගල්ඔය වන රක්ෂිතයට අනවසරයෙන් බැහැර කරමින් පැවති අතර ඒ සඳහා විධිමත් පරිදි පල්දෝරු පද්ධතියක් සකස් කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ධාවන තත්ත්වයේ නොපවතින රු. 16,482,050 ක් වටිනා රථ වාහන 04 ක් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) 2017 ජනවාරි මාසයේදී මාර්ග තලන යන්ත්‍රයේ මෝටර් දෙකක් අලුත්වැඩියාව සඳහා පුද්ගලික සමාගමට යවා තිබුණද අලුත්වැඩියා කර ආපසු ලබාගෙන නොතිබුණු අතර ඒ පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි.

(ඇ) විධිමත් පරිදි ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොතිබුණු හා භූමියේ අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණු අඩක් නිම කරන ලද මෙම ගොඩනැඟිල්ලෙහි උඩු මහල සඳහා දරන ලද වියදම නිෂ්ඵල වී තිබුණි.

(ඈ) හිඟුරක්ගොඩ නගර මධ්‍යයෙහි පිහිටි සභාව සතු හෝරාස්ථම්භය 2014 වර්ෂයේ සිට ද, ජයන්තිපුර හෝරාස්ථම්භය වර්ෂ ගණනාවක සිටද අක්‍රියව පැවති අතර ඒවා අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කලමණාකරණය

--------------------------------------

(අ) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ස්ථිර සේවකයන් 08 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි.

(ආ) ස්ථාන මාරුවී ගිය, මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් වූ, සේවයෙන් ඉවත් කල හා සේවය හැරගිය නිලධාරීන් 58 දෙනෙකුගෙන් එකතුව රු. 668,318 ක් අයකර ගත යුතුව පැවතුණි.

3.4 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් පරිපාලකවරුන්ගේ හා කාර්මික නිලධාරීන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් අනාවරණය වී තිබූ අනවසර ඉදිකිරීම් 18 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) හිඟුරක්ගොඩ දුම්රිය රක්ෂිතයේ සභාව විසින් පවත්වාගෙන යනු ලබන කඩ කාමර සඳහා වාර්ෂික බදු කුලිය රු. 523,250 ක් සභාව විසින් ගෙවනු ලැබුවද වර්ෂය තුල සභාවටලැබී තිබූ ආදායම රු. 135,000 ක් පමණක් විය.

(ඇ) සභා අරමුදල් වැය කර සකස් කරන ලද නීතිඥ කාර්යාල 16 ට අදාල ගොඩනැඟිල්ලෙහි හිඟ ටෙන්ඩර් මුදල වූ රු. 3,205,825 ක් සහ මාසික කුලිය වූ රු. 352,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. කඩ කාමරයක් සඳහා තක්සේරු කිරීමකින් තොරව රු. 500 ක් මාසිකව අය කිරීමට තීරණය කලද 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම එම මුදල ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

3.5.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය මඟින් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට 2015 මාර්තු 31 දින ලබාදුන් ජීව වායු ඒකකය භාවිතයට ගෙන නොතිබූ බැවින් නිෂ්කාර්ය වත්කමක් බවට පත්වී තිබුණි.

(ආ) රු. 130,862 ක් වටිනා සිමෙන්ති බ්ලොක් ගල් සෑදීමේ යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) පළමුවන හරස් වීදියේ පිහිටි කඩ කාමර ගොඩනැඟිල්ලෙහි උඩු මහලේ අබලන් වූ කඩ කාමර 05 ක් සහ ඊට යාබදව ඇති ශාලාවද වර්ෂ ගණනාවක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) සභාවේ ජල යෝජනා ක්‍රම 7ට අදාළ ඉඩම් හා උපකරණ, මින්නේරිය, පුස්තකාලයට අයත් අක්කර 03 ක ඉඩම, නාගලකන්ද පැරණි ගම්සභාවට අයත් වැසිකිලිය පිහිටි අක්කර 01 ක ඉඩම, මින්නේරිය පොදු වැසිකිලිය සහිත අක්කර 01 ක ඉඩම, පුලතිසිගම පෙර පාසල සහිත ඉඩම, ජයන්තිපුර උප කාර්යාලය, ජයන්තිපුර හෝරා ස්ථම්භය යන වත්කම්වල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6 ප්‍රසම්පාදනය

------------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------

සභාව විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආර්.බී.අයි. මාරසිංහ වත්ත ක්‍රීඩා පිටිය අසල මාර්ගය කුට්ටි ගල් අල්ලා සංවර්ධනය කර තිබුණු අතර මාර්ගය දෙපස දමා තිබූ පස් තීරුව සේදී යාම නිසා කාණු පද්ධතිය ඇහිරී තිබුණි. තවද එම මාර්ගයේ පැති බැම්ම ආසන්නයේ ඇතැම් ස්ථාන සුළු වශයෙන් ගිලා බැස තිබුණු අතර මතුපිට මට්ටම් කර නොතිබුණි.

(ආ) හිඟුරක්ගොඩ සේවා පියසට යාබද ව සංවර්ධනය කරන ලද ක්‍රීඩා පිටියේ ඇතැම් ස්ථානවල පස් තුනී කර තලා නොතිබුණු බැවින් ගොඩැලි සහිත තත්වයක් පැවතුණ අතර පස් සේදී ගොස් තිබුණි.

(ඇ)(i) උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (NELSIP) ව්‍යාපෘතියේ අරමුදල් භාවිතා කරමින් රු. 40,107,396 ක ගිවිසුමක් යටතේ හිඟුරක්ගොඩ බස් නැවතුම්පල අසල වෙළඳ සංකීර්ණය ඉදිකර 2017 ජුනි 20 දින සභාවට භාරදී තිබූ අතර ඒ වෙනුවෙන් වැට් රහිතව රු. 51,177,249 ක බිල්පතක් ඉදිරිපත් කර තිබුණද ගිවිසුම් වටිනාකමට අමතරව සිදුකර තිබුණු රු. 11,069,853 ක වැඩ වටිනාකම් සඳහා කිසිදු අනුමැතියක් ලබාදී නොතිබුණි.

(ii) ඉහත ගොඩනැගිල්ල සඳහා විදුලිය නොමැති වීම නිසා කඩ කාමර මෙතෙක් විවෘත කර නොතිබුණි.

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සභාව විසින් ආදායම් ප්‍රභවයන් සහ වියදම් නිසිලෙස හඳුනා නොගෙන ඇස්තමේන්තු සකස් කිරීම නිසා ආදායම් විෂයයන් 07 ක සියයට 7 සිට සියයට 100 දක්වා පරාසයකින්ද වියදම් විෂයයන් 07 ක් සියයට 12 සිට සියයට 134.5 ක් දක්වා පරාසයකින්ද විචලනය වී තිබූ බැවින් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් වශයෙන් භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | වත්කම් ඌණ උපයෝජිතව පැවතීම |
| | | (ii) | සමීක්ෂණ නොකිරීම |
| | | (iii) | සියලුම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර යාවත්කාලීනව පවත්වා ගෙන නොයෑම |
| | | (iv) | වත්කම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | හිඟ ආදායම් අය නොකිරීම |
| | | (ii) | කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් නොපැවැත්වීම හා ලේඛනගත නොකිරීම |

| | | | |
|---|---|---|---|
| | | (iii) | අතුරු ව්‍යවස්ථා නොපැනවීම |
| (ඇ) | ණයගැති /ණයහිමි පාලනය | (i) | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් නොකිරීම |
| | | (ii) | කාල විශ්ලේෂණ සකස් නොකිරීම |
| | | (iii) | උපලේඛන පවත්වා නොගැනීම |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | කසල කලමනාකරණය සඳහා භූමියක් පවරා නොගැනීම |
| | | (ii) | කසල වර්ගීකරණය කිරීමකින් තොරව අපහරණය කිරීම |
| | | (iii) | අවිධිමත් ආකාරයට රක්ෂිතයට කසළ මුදා හැරීම |
| | | (iv) | කසළ ප්‍රතිචක්‍රීයකරණයට යොමු නොවීම |

.